# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1974/14 - 2016 ජූලි මස 05 වැනි අඟහරුවාදා - 2016.07.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන *ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන *ඉඩමේ/පරවශතාවේ විස්තර* :

උතුර පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ, වලිකාමම් නැගෙනහිර කෝප්පායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉරුපලෙයි දකුණ J/257 ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ, ගම - ඉරුපලෙයි, මුද්‍රිත පිඹුර - යා 2841.

1. **කැබලි අංක 1**

ඉඩමේ නම: කඩ්ඩුවාසල් තලයඩි; විස්තරය: ළිඳ සහිත පොල් ගස් දෙකක ඉඩම; හිමිකම් කියන අය : පී. ඥාණදාස්; ප්‍රමාණය : හෙක්ටයාර් 0.2339

ඉහත සඳහන් *ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 සැප්තැම්බර් මස 05 වැනි දින පෙ.ව. 10.00ට වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2016 අගෝස්තු මස 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී *ඉඩම/පරවශතාව ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එම්. ප්‍රදීපන්,  
ප්‍රාදේශීය ලේකම්,  
වලිකාමම් නැගෙනහිර කෝප්පායි.

2016 ජූලි මස 01 වැනි දින,  
වලිකාමම් නැගෙනහිර කෝප්පායි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 844

---

ශුද්ධි පත්‍රයයි

### 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : මො/ආ සං/03/අත්/17.

*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4/3/13/2010/එච් ඒ/317.

අංක 1958/26 හා 2016.03.17 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* යොමු අංක මො/ආ සං/03/අත්/ 17 යටතේ පළකරන ලද 7 වන වගන්තිය යටතේ දැන්වීමේ සඳහන් ඉඩමේ අයිතිවාසිකම් ඉදිරිපත් කිරීම සහ සම්මුඛ විය යුතු දිනය වශයෙන් යොදා ඇති 2016.03.10 දිනය 2016.07.22 දිනය වශයෙන් ද, හිමිකම් වෙනුවෙන් ඉල්ලීම් ඉදිරිපත් කළයුතු දිනය 2016.07.29 දිනය වශයෙන් සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

ජේ. එම්. යූ. කේ. ජයසේකර,  
ප්‍රාදේශීය ලේකම්,  
මොණරාගල.

2016 ජුනි මස 30 වැනි දින,  
මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 845

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 23775 - 33 - (2016/07)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.